# ඓතිහාසික පඬුවස්නුවර රාජධානියේ නිකසලානුවර මැදගම කන්ද ආශ්‍රිතව සිදු කරන ලද පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක්

එස්. පී. සී. සේනාධීර[1]

## හැඳින්වීම

පුරාණ ශ්‍රී ලංකාවේ පිහිටි රාජධානි අතුරින් උපරාජධානියක් වශයෙන් පඬුවස්නුවර රාජධානිය සුවිශේෂී පුරාවිද්‍යාත්මක ක්ෂේත්‍රයක් වශයෙන් හඳුනා ගත හැකිය. මෙම රාජධානියෙහි ඓතිහාසිකත්වය අධ්‍යයනය කිරීමේ දී තදාශ්‍රිත ස්ථානපිළිබඳව ද අවධානය යොමු කළ යුතු වේ. මෙහිදී අධ්‍යයනයට ලක්කළ මැදගම කන්ද ක්ෂේත්‍රය ද මෙහි ලා වැදගත් වේ.

## අරමුණු

මෙම අධ්‍යයනය මගින් නිකසලානුවර විහාරස්ථානය ආශ්‍රිතව පිහිටා ඇති මැදගම කන්දෙහි ස්ථානගත වී ඇති පුරාවිද්‍යා ස්මාරක හඳුනා ගැනීමත්, ඒවායෙහි අන්තර්ගත පුරාවිද්‍යාත්මක වටිනාකම සොයා බැලීමත් අරමුණ විය.

## ක්‍රමවේදය

මූලික වශයෙන් මෙම අධ්‍යයනයේදී මැදගම කන්ද ක්ෂේත්‍රය ගවේෂණය කොට මූලික දත්ත රැස් කර ගන්නා ලදී. එමෙන්ම මෙම ස්ථානය සම්බන්ධයෙන් ක්ෂේත්‍ර නොවන අධ්‍යයන යටතේ පුස්තකාල සමීක්ෂණය මගින් සෘජුව හා වක්‍රව තොරතුරු ලබා ගත හැකි සාහිත්‍ය මූලාශ්‍රය පරිශීලනය කරන ලදී.

## සාකච්ඡාව

මෙම අධ්‍යයනයේදී හඳුනාගත් පුරාවිද්‍යාත්මක සහ සාහිත්‍ය මූලාශ්‍රයවලට අනුව පැහැදිලිවන්නේ මැදගම කන්ද පූර්ව ඓතිහාසික යුගයේ සිට ජනාවාසකරණයට ලක්වී ඇති බවත් අනුරාධපුර යුගයේ පටන් මහනුවර යුගය දක්වා ක්‍රමික විකාශයක ලක්ෂණ පෙන්නුම් කරන බවත් ය. ශිලාලේඛනගත සාධකවලට අනුව මැදගම කන්දට උතුරින් පිහිටා ඇති නිකසලානුවර රජමහවිහාරය අතීතයේ "මහාගිරිචේතියාරාමය" වශයෙන් හඳුන්වා තිබේ. එහි අර්ථය වන්නේ මහා කන්දක් කේන්ද්‍රකරගෙන බිහිවූ විහාරස්ථානය යන්නයි. මේ

[1] පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
chamalsenadheera1992@gmail.com

අනුව මැදගම කන්ද පාමුල පිහිටා ඇති නිකසලානුවර රජමහා විහාරස්ථානය බිහිවීම සඳහා ඊට දකුණින් ඉහළට විහිදෙන මැදගම කන්ද තීරණාත්මක සාධකයක් වී ඇතිබව අතීතයේ විහාරස්ථානය සඳහා භාවිත කර ඇති නමින්ම පැහැදිලි වේ. එමෙන්ම ක්‍රි. පූ. 3වන සියවසේදී මැදගම කන්ද ආශ්‍රිතව බිහිවූ ලෙන් ආරාම සංකීර්ණයේ වර්ධනීය අවස්ථාවක් ලෙස නිකසලානුවර රජමහ විහාරස්ථානය හැඳින්විය හැකිය.

ක්‍රි.ව. මුල් කාලයේදී භික්ෂූන්වහන්සේලාගේ ආවාස සඳහා ලෙන් විහාර එක් දහස් පන්සියයකට අධික ප්‍රමාණයක් භාවිතව තිබූ බව දැක්විය හැකිය. ලෙනක් සුදුසු පරිදි සකස් කොට භික්ෂූන්වහන්සේලා වෙත පූජාකිරීම රාජකීයවරුන්, පරුමකවරුන්, ගමණිවරුන්, ගමිකවරුන්, බ්‍රාහ්මණවරුන්, ගපතිවරුන් ඇතුළු විවිධ පුද්ගලයින් අතින් සිදුවිය.මැදගම කන්දේ පිහිටා ඇති බ්‍රාහ්මී ලෙන් ලිපි දෙකක මෙසේ සඳහන්වේ.

"දඩතිශහබඪය පරුමකලුපුවලයලෙණෙ"

ක්‍රි.පූ. 02-ක්‍රි.ව. 01 දක්වා කාලනිර්ණය කර ඇති මෙම ලිපියේ අර්ථය " දඩතිස්සගේ භාර්යාව වූ ප්‍රමුඛ පුවලය නැමැත්තියගේ ලෙණයි" යන්න ය(චන්දානන්ද, 2012;06). මෙම ප්‍රදේශය ආශ්‍රිතව පැවති පාලන තන්ත්‍රයට ස්ත්‍රී පාර්ශවය ද දායක වී ඇති බව "පරුමකලු පුවලය" යන කොටසින් පැහැදිලිවේ. මේ අනුව එකල මෙම ප්‍රදේශයේත් ලංකාවේ බොහෝ ප්‍රදේශවල මෙන් කාන්තාවට සමාජයේ හිමිවූ ස්ථානය පිළිබඳව පැහැදිලිවේ. මීට අමතරව මැදගම විහාරයේ ඇති තවත් ශිලාලේඛනයක් මෙසේය.

"නඩ-තිසහ බරිය පරුමකලි හුම(න)ය ලෙනෙ"(පරණවිතාන,1970;71)

මෙම ශිලාලේඛනයට අනුවත් සමකාලීන සමාජයේ පැවතුණු ආගමික පසුබිම මෙන්ම සමාජයේ තිබූ විවිධ වෘත්තීන් සහ එක් එක් වෘත්තීන්ට එකල සමාජයේ හිමිවූ ස්ථානයත් කාන්තාවට සමාජයේ හිමිවූ උසස් ස්ථානයත් පිළිබඳව පැහැදිළිවේ.

මැදගම කන්දේ දක්නට ලැබෙන මෙම බ්‍රාහ්මී අක්ෂර සහිත ලෙන් ලිපි අනුවත්, ගවේෂණයෙන් අනාවරණය කරගත් කටාරම් සහිත ලෙන් අනුවත් මැදගම කන්ද ආශ්‍රිත ලෙන් ආරාම සංකීර්ණය ක්‍රි.පූ. 3 හෝ ඊට පසුකාලීනව ඇතිවූවක් විය හැකිය. ක්‍රි.පූ. තෙවන සියවසේ පමණ සිට ක්‍රි. ව. 2වන සියවස තෙක් විහිදෙන බ්‍රාහ්මී ශිලාලිපි රාශියක් කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් සොයාගෙන ඇත. අනුරාධපුර දිස්ත්‍රික්කය හැරුණුවිට ශ්‍රී ලංකාවේ වැඩිම බ්‍රාහ්මී ශිලාලිපි සංඛ්‍යාවක් ලැබී ඇත්තේ කුරුණෑගල දිස්ත්‍රික්කයෙනි. මේ අනුව අනුරාධපුර යුගයේ මුල්භාගයේදී

අනුරාධපුරයට සමාන වැදගත්කමක් මේ ප්‍රදේශය උසුලන්නට ඇත (ඉලංගසිංහ. 2008; 88).

නිකසලානුවර රජමහා විහාරස්ථානයේ සිට විජය සොහොන දක්වා ඇති මාර්ගයේ ඉහළට ගමන් කරන විට ලෙන් විහාරය ආශ්‍රිතව දක්නට ලැබෙන ලෙන්වල බ්‍රාහ්මී ලිපි දක්නට ලැබේ. මෙම අධ්‍යයනයේ දී හමුවූ ලෙන් 19 අතුරින් එකකවත් බ්‍රාහ්මීලෙන් ලිපි හමුනොවුණි.

භික්ෂූන්වහන්සේලාට මෙම ලෙන් කටාරම් කොටා පූජාකිරීමට ප්‍රථම මෙම ලෙන් අතුරින් කිහිපයක් හෝ ප්‍රාග් ඓතිහාසික යුගයේ මානවයා තම වාසස්ථාන ලෙස භාවිතකරන්නට ඇති බව එම ලෙන්වල පිහිටීම අනුව උපකල්පනය කළ හැකිය. මැදගම කන්ද ආශ්‍රිත අධ්‍යයනයේදී පර්වත ආවරණ සහ ගුහා යන ක්ෂේත්‍ර දෙකම හමුවිය. එමෙන්ම ගල් තලා ආශ්‍රිතව ස්වභාවිකව තැනුණු පොකුණු කිහිපයක් ද දැකගත හැකිය. මීටඅමතරව අවට පරිසරය හොඳින් දර්ශනය වන එළිමහන් ස්ථානත් දක්නට ලැබෙයි. නමුත් මෙම ස්ථාන ආශ්‍රිතව ප්‍රාග් ඓතිහාසික මානවයන් වාසයකළාද යන්න නිගමනයකිරීම සඳහා මේ වනතෙක් විද්‍යාත්මක කැණීමකින් අනාවරණය කරගෙන නැත. ගල් තලාව ආශ්‍රිතව බෙහෙත් ඇඹරීම වැනි කටයුතු සඳහා භාවිත කරන ලද ගලේ හාරන ලද වළවල් දැකගත හැකි අතර මේවා භාවනානුයෝගීව සිටි භික්ෂූන් වහන්සේලාගේ අවශ්‍යතා සඳහා භාවිතා කරන්නට ඇත. එමෙන්ම ගවේෂණයේ දී ගොඩනැගිල්ලක පාදමක කොටසක් හමුවිය. ඇතැම් විට මෙය විජය සොහොන ඉදිකළ සමයේ ඉදිකරන ලද්දක් විය හැකි ය. ඇතැම් අයගේ මතය වන්නේ මෙය පළවන පරාක්‍රමබාහු රජතුමා දක්ඛිණදේශයේ පාලකයාව සිටිකාලයේදී ඉදිකරන ලද්දක් විය හැකි බවයි. මෙම ගොඩනැගිල්ල ආශ්‍රිතව මෑතකාලීනව පස සේදීයාම වැලැක්වීම සඳහා යොදන ලද කළුගල් වැටි කිහිපයක් හඳුනාගත හැකිවිය. මෙම ස්ථානය ආශ්‍රිතව මිනිසුන් වගා කටයුතු සිදුකර ඇති බව අවට මිනිසුන් වසින් සිටුවන ලද ශාක වර්ග තිබීමෙන් පැහැදිලි වේ. එමෙන්ම මෙම ස්ථානයේ විශාල ළිඳක් දැකගත හැකිය. ඇතැම්විට මෙය ළිඳක් හෝ නිදන් හොරුන් විසින් හාරන ලද වළක් විය හැකිය.

පූර්ව ඓතිහාසික යුගය වන විට ස්වභාවිකව පිහිටි ගල්ලෙන් තුළට වැසි ජලය කාන්දුවීම වැලැක්වීමට කටාරමක් කොටා එම ලෙන භික්ෂූන්වහන්සේලාට පූජා කළ බවට ලිපියක් කොටා ඇත. මෙවැනි දියුණු යකඩ තාක්ෂණයක් තිබීමට නම් දක්ෂ යකඩ කාර්මික ශිල්පීන් සිටිය යුතු ය. නිකසලානුවර වැඩබිම මගින් සිදුකර ඇති මානවවංශ අධ්‍යයනය මගින් වර්තමානය වනවිටත් එම පාරම්පරික කර්මාන්තයේ නෂ්ටාවශේෂයන් දැකගත හැකි බව සොයාගෙන තිබේ. මෙම ගවේෂණයේදී පාරම්පරික යකඩ කර්මාන්තයේ නියැලෙන ශිල්පීන් දෙදෙනෙකු

හඳුනාගැනීමට හැකිවී ඇත. ඉන් එක් අයෙකු පඬුවස්නුවර බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මීගස්පිටිය ග්‍රාමසේවා වසමේ ලෝකුරුගම ග්‍රාමයේ වාසය කරන උඩුනුවර චිත්‍ර ආචාරිලාගේ ජුවානිස් හාමි සහ කොබෙයිගනේ ප්‍රාදේශීය ලෙකම් කොට්ඨාසයේ, හල්මිල්ලකොටුව ග්‍රාමයේ පදිංචි ඩබ්. එන් සීමන්හාමිය. මෙයින් දැනට අවුරුදු 72ක් පමණ වන ජුවානිස් හාමි ලෝකුරුගම පැවති කම්මල් කර්මාන්තයේ අවසන් පුරුක සේ සැලකිය හැකි ය. මොහුගේ නම ද පාරම්පරික ලෝහ කර්මාන්තයේ නියැළුණු පරපුරකට අයත් පුද්ගලයෙකු බැව් ප්‍රත්‍යක්ෂ වේ. එනම් මහනුවර රාජධානි සමයේදී කම්මල්කරුවන්, රිදීවැඩකරුවන්, පිත්තලකරුවන්, දැවවඩුවන්, ප්‍රතිමා හා සිතුවම්කරුවන්, හැඳින්වීම සඳහා භාවිත කරන ලද පොදු නාමය වන "ආචාරි" යන්නය. (Davy, 2006)(පීරිස්, 2012) මොහු ජීවත්වන භූමිය සහ ඒ අවට සුළු ලෙස යබොර හමුවන බවත් අතීතයේදී සිය කර්මාන්තය සඳහා යපස් රැගෙන ආවේ පුත්තලම දිස්ත්‍රික්කයේ පනිරෙන්ඩාවෙන් බවත්ය (ඉන්දික,2014;27). විශේෂයෙන්ම පඬුවස්නුවර රාජධානියේ ඉදිකිරීම් සඳහා අවශ්‍යකරන පාෂාණ ලබාගැනීමට පාෂාණ විභේදනයකරගැනීමටත් ඊට පූර්ව කාලයේදී ස්වභාවික ලෙන්වල කටාරම් කොටා භික්ෂූන්වහන්සේලාට පූජාකිරීමටත් භාවිතාකර තිබේ.

මැදගම කන්ද ගවේෂණයේදී හමුවූ පාෂාණ විභේදනයකිරීම සඳහා පාෂාණවල සිදුරු විදින ලද ස්ථාන හඳුනාගත හැකිවිය. මේ අනුව එම පාෂාණ නිකසලානුවර විහාරස්ථානයේ ඉදිකිරීම් වලටත්, පඬුවස්නුවර රාජධානියේ ඉදිකිරීම් සඳහාත් භාවිත කරන්නට ඇත. පාෂාණ ආශ්‍රිත මෙම විභේදනයකරගැනීම් පාෂාණ තුළ පවතින ඛණිජ තීරු අළලා සිදුකරන ලද සිදුරුවිදීමක් බව හඳුනාගෙන තිබේ. විභේදනයට සකසා ඇති සිදුරු පිළිබඳව ලංකාවේ ස්ථාන ගණනාවක් ඇසුරෙන් සිදුකරන ලද මිනුම්ගතකිරීමක් අනුව එම සිදුරුවල ප්‍රමාණය බොහෝ දුරට එක සමාන බව හඳුනාගෙන තිබේ (මැන්දිස්, විතානාච්චි, 2011;68). මැදගම කන්ද ගවේෂණයේදී හඳුනාගත් පාෂාණය විභේදනයකිරීම සඳහා විදින ලද සිදුරුවල දිග සහ පළලත් වෙස්සගිරිය, ජේතවනාරාමය වැනි ස්ථානවලින් හමුවී ඇති පාෂාණවල විදින ලද සිදුරුවල දිග හා පළලට යම්කිසි සමානත්වයක් ඇති බව හඳුනාගත හැකිය.

මෙම ප්‍රදේශය මුල් කාලයේ "කුඹල් ගම" නමින් හඳුන්වා තිබේ. ඒ අනුව මැටි කර්මාන්තය යටතේ වළං කර්මාන්තය දියුණු මට්ටමක පවතින්නට ඇත. නිකසලානුවර ක්ෂේත්‍රය ආශ්‍රිතව සිදුකර ඇති කැණීම්වලදී මැටි බඳුන් කැබලි විශාල වශයෙන් හමු වේ. ඊට අමතරව උළුද හමු වේ.අඹගහවැව කුඹල් ගම්මානය මෙන්ම ප්‍රසිද්ධ නොමැතිවුවත් මැදගම ගම්මානය ද පුරාණ මැටි භාණ්ඩ නිෂ්පාදන

ගම්මානයක් වශයෙන් සැලකෙයි. මෙසේ මැදගම ගම්මානයේ නිපදවන බඳුන් හෝ අඹගහවැව ගම්මානයේ නිපදවන මැටි බඳුන් රජමාළිගාවේ, විහාරස්ථානයේ, සාමාන්‍ය ජනතාවගේ නිවාසවල විවිධ අවශ්‍යතාවන් සඳහා භාවිතකර තිබේ. මේ අනුව මැදගම කන්ද ගවේෂණයේදී හමුවූ මැටි බඳුන් කැබලි බැතිමතුන් විසින් ලෙන්වල වැඩවාසය කරන භික්ෂූන්වන්සේලා සඳහා දානය රැගෙන ගිය බඳුන් අවශේෂ විය හැකි ය.

**ප්‍රමුඛ පද:** මැදගම කන්ද, කුඹල් කර්මාන්තය, ශිලා ලේඛන ,පූර්ව ඓතිහාසික

**ආශ්‍රිත ග්‍රන්ථ**

ඉන්දික ඩබ්. එම්. (2014). *පඬුවස්නුවර අවට මානවවංශ ගවේෂණය.* මධ්‍යම සංස්කෘතික අරමුදල (අප්‍රකාශිතයි)

චන්දානන්ද, මන්දාරම්නුවර. (2012). *පඬුවස්නුවර නිකසලානුවර අභිලේඛන වාර්තාව.* මධ්‍යයම සංස්කෘතික අරමුදල (අප්‍රකාශිතයි)

මැන්දිස් තුසිත, ඩී., විතානාච්චි, චන්දන රෝහණ. (2011). *ශ්‍රී ලංකාවේ පුරාණ තාක්ෂණය හා සම්පත් පරිහරණය.* වාරියපොළ: වරුනි ප්‍රකාශන.